**තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3හි 7 ඡේදයේ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස බස්නාහිර පළාත සඳහා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම (VET Plan) සකස් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන වලින් රු.1,468,795ක් අදාල කාර්යය ඉටුකිරීමකින් තොරව උපචිත වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා උපචිත වියදම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2023 වසරේදී එම උපචිත වියදම් වෙනුවෙන් ගෙවන ලද අගයන් උපචිත ගිණුම මඟින් ගිණුම්ගත කිරීමට පියවර ගෙන ඇත. ඉතිරි රු.712,814 වටිනාකම නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | ඉටුනොකල කාර්යයන් වෙනුවෙන් උපචිත වියදම් සඳහා වෙන්කිරීම් නොකල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය අනුව, වත්කම් ප්‍රත්‍යාගණනයකදී එම වත්කම් අදාල පංතියට අයත් සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කලයුතු වුවත් කොමිෂන් සභාවට අයත් මෝටර් වාහන ප්‍රත්‍යාගණනයේදී කැබ් රථයක් ප්‍රත්‍යාගණනයෙන් අත්හැරී තිබුණි. එහෙත් එම කැබ් රථයේ රු.1,750,000 ක් වූ පිරිවැය දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත නොකර ඊට අදාල රු.1,726,610 ක් සමුච්චිත ක්ෂය ලෙස ගිණුම්ගත කර තිබුණි. | 57-7603 අංක දරණ කැබ් රථය අළුත්වැඩියාව පිණිස යොමු කර ඇති බැවින් ප්‍රත්‍යාගණනය සඳහා භාජනය කල නොහැකි වුවද එම රථය අලුත්වැඩියා කල වහාම ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගන්නා බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 52 ඡේදය අනුව ප්‍රත්‍යාගණන ප්‍රතිඵලයක් ලෙස වත්කම් පන්තියක ධාරණ අගය වැඩිවන විටක එම වැඩිවීම ඍජුවම | ප්‍රත්‍යාගණනයට අදාල ප්‍රත්‍යාගණන අතිරික්තය විලම්භිත ආදායම් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ |

| | | | |
|---|---|---|---|
| | ප්‍රත්‍යාගණන අතිරික්තයට බැරකල යුතු වුවද කොමිෂන් සභාවේ වත්කම් ප්‍රත්‍යාගණනයේදී වත්කම් පංති 7කට අදාලව රු.90,383,696 ක් වූ ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කිරීම වෙනුවට විලම්භිත ආදායම් ගිණුමට බැර කර තිබුණි. එමෙන්ම එම ප්‍රමිතයේ 53 ඡේදය අනුව එක් වත්කමක ප්‍රත්‍යාගණිත අගය අඩුවීම එම වර්ෂයේ අතිරික්තයට හෝ ඌනතාවයට හඳුනාගත යුතු වුවත් පරිගණක හා උපාංග වත්කම් පංතියට අදාලව හඳුනාගත් රු.171,453 ක් වූ ප්‍රත්‍යාගණන අලාභය ප්‍රවර්තන වර්ෂයේ අතිරික්තයට ගැලපීම වෙනුවට අනෙකුත් වත්කම්වල ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් හිලව්කර දක්වා තිබුණි. | ගිණුමෙන් ඉවත් කොට වෙනම පෙන්වීම සඳහා අදාල ජර්නල් සටහන් 2023 ආරම්භයට යොදන බව. | ප්‍රමිත වලට අනුකූලව ප්‍රත්‍යාගණන අතිරික්තය හෝ ඌනතාවය ගිණුම්ගත කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 අනුව කොමිෂන් සභාව විසින් මූල්‍ය වාර්තා කරන දිනට පැවති සියළුම තොග අයිතමයන් පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු වටිනාකමට මිනුම් කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.10,843,810 ක්වූ සහතික පත්‍ර හා ඇගයුම්කරුවන් සඳහා ලබා දෙන කබා (Assessor Overcoat) අවසන් තොගය ලෙස ගණනය කර නොතිබීම හේතුවෙන් වර්ෂ අවසාන තොගය හා අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එසේම ඉතිරි තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සහතික පත්‍රවල ඉතිරි තොග ගිණුම්වලට ගැලපීම 2023 වසරේ සිට සිදු කරන බව. | සියළුම අවසන් තොග ගිණුම් ගත කළ යුතු අතර එම තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණු රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන රු.2,587,278 ක් සහ අනෙකුත් ප්‍රාග්ධන ප්‍රදාන රු.1,382,798 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව හඳුනා ගැනීම හා මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කිරීම සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ශුද්ධ වත්කම් වෙනස්වීමේ ආකෘතිය අනුව ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයේ වෙනම හෙළිදරව් කිරීමට පියවර ගන්නා බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ප්‍රාග්ධන ප්‍රදාන හඳුනාගෙන අදාල පරිදි ගිණුම්ගත කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට බාහිර ආයතන 04 ක් සඳහා සහතිකපත් නිකුත් කිරීම වෙනුවෙන් රු.34,418,355 ක ආදායමක් ලැබිය යුතු වුවද මූල්‍ය ප්‍රකාශන තුළ එම ආදායම රු.9,348,689ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු ආදායම රු.25,069,666 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්ගතවීමට ඉදිරිපත් කර නොතිබූ ඉන්වොයිසි නැවත පරීක්‍ෂා කර ගිණුම්ගත කිරීමට පියවර ගන්නා බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ උපචිත වියදම් යටතේ දක්වා තිබූ මුද්‍රණ වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.3,082,418 ක මුදල් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා උපචිත වියදම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම වියදම 2023 වර්ෂයේදී පෙර වර්ෂ ගැලපීම් මඟින් නිවැරදි කර ඇති බව. | වර්ෂයේ අතිරික්තය / ඌනතාවය නිවැරදිව ගණනය කිරීම සඳහා වර්ෂයට අදාල වියදම් පමණක් අදාල කරගත යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හා වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ආදායම් කාණ්ඩ 07 | 22,279,725 | 60,640,900 | 38,361,175 | ඇගයුම් අංශය මඟින් ලැබිය යුතු යැයි තහවුරු කරන ලද ඉන්වොයිස්පත්වල අගය පමණක් ආදායමට ගිණුම්ගත කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

### 1.5.4 හඳුනානොගත් වෙනස්කම්

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවෙන් ලැබිය යුතු මුදල රු.12,343,157 ක් ලෙස දක්වා තිබුණද කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන වල ගෙවියයුතු ලෙස දක්වා තිබුණේ රු.2,018,589 ක් පමණි. මේ අනුව රු.10,324,568 ක හඳුනා නොගත් වෙනසක් පැවතුණි. | මුද්‍රණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු සත්‍ය මුදල පරීක්ෂා කර 2023 දී ගිණුම් වලට ඇතුළත් කරන බව. | බාහිර ආයතන සඳහා ගෙවිය යුතු මුදල් සඳහා නිවැරදිව ලේඛන පවත්වා ගැනීම හා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී තහවුරු කිරීම් ලබා ගත යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ආදායම් කාණ්ඩ 09 | 40,898,093 | අයකරනු ලබන ආදායම්, අයකර ගත් ආදායම් නිශ්චය කිරීමට හා හඳුනා ගැනීමට අදාල අනුමැතීන් | ආදායම් ඉපැයීමට ලත් අනුමැතියන්හි මූලාශ්‍ර පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර බලා නිවැරදි තොරතුරු ඉදිරියේදී ඉදිරිපත් කරන බව. | මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ආදායම් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ආ) | NVQ සහතිකපත් මුද්‍රණ වියදම | 6,537,091 | 2022 වර්ෂයේදී වියදම් ලෙස තහවුරු කිරීම සඳහා වන ඉන්වොයිස්පත්‍ර | 2022 වර්ෂය වෙනුවෙන් තත්ත්ව ආරක්ෂණ ඇගයුම් පාලන අංශය මඟින් ඉදිරිපත් කල ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් මුද්‍රණ සඳහා වූ වවුචර්පත් සඳහා පවත්නා ප්‍රතිපාදනවලට යටත්ව ගෙවීම් කර ඇත. නිසි අනුමැතියකින් යුත් වවුචර් සඳහා කරන ලද ගෙවීම් එනම්, ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන යටතේ අදාල වියදම සඳහන්ව ඇති බව. | මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කරන ලද වියදම් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ඇ) | අත්තිකාරම් | 4,207,767 | 2017 වර්ෂයේදී ගෙවීම් පියවීම සඳහා ඉදිරිපත් කල වවුචර් හා රිසිට්පත් | 2017 වසරේදී ගිණුම්කරණ පැකේජය අක්‍රීය වීමත් සමඟ වවුචර්පත් නව | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | | පැකේජයට ඇතුළත් කිරීමේදී පියවීම් වලට අදාළ වවුචර්පත් කීපයක් අත්හැරී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී පියවීම් සටහන් යෙදීමට කටයුතු කළ බව. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට ගෙවිය යුතු රු.1,880,445 ක ණයහිමි ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිරවුල් කර නොතිබුණි. | 2023 වසරේ දී ජ'නල් සටහන් මගින් මෙය නිවැරදි කර ඇති බව. | ණයහිමි ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | ආපසු ගෙවිය යුතු කෙටි කාලීන ප්‍රදාන(short term refundable grant) තුල ඇතුලත්ව තිබුණු වසර 5 ඉක්ම වූ එකතුව රු.1,192,339 ක් වූ තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | බාහිර ආයතන වෙතින් නිපුණතා සම්මත සැකසීම සඳහා ලබා දෙන ලද අරමුදල් මගින් වැය වූ මුදල් හඳුනා ගෙන එම අගයන් ආදායම් ගිණුමට මාරු කිරීමට පියවර ගන්නා බව. | දීර්ඝ කාලීන ආපසු ගෙවිය යුතු තැන්පත් හඳුනාගෙන නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති,රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ජේදය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි<br>(අ) මුදල් රෙගුලාසි 371(2) (ආ) | යම් විශේෂිත කාර්යයක් සඳහා එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් අතුරු අග්‍රිම ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස අවස්ථා 02 කදී රු.1,536,860 ක් හා රු.1,404,987 ක් ලෙස අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | රට තුළ පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් ඇගයුම් අංශයේ අධ්‍යක්ෂවරිය නමින් අත්තිකාරම් ලබාගෙන විභාග මධ්‍යස්ථාන රාජකාරී භාරව සිටි නිළධාරීන්ගේ ගිණුම් වලට නියමිත සීමාවලට යටත්ව මුදල් තැන්පත් කරන ලද බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ). මුදල් රෙගුලාසි 371(5) | යම් අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යයන් අවසන් වූ වහාම එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත් 2017 වර්ෂයට පෙර සිට පැවත එන කොමිෂන් සභාවේ නිලධාරීන් 77දෙනෙකුට ලබා දී තිබූ තත්කාර්ය අතුරු අග්‍රිම රු.3,521,058 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල්කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අතුරු අග්‍රිම කඩිනමින් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,722,454 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,548,803 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,271,257 වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ජාතික නිපුණතා සහතික සඳහා අයකරන ගාස්තු වැඩිවීම හා රජයේ ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රදාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ප්‍රදාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසදා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම් ප්‍රතිශතයක් ලෙස පහත දැක්වේ**.**

| | **2022** | **2021** | **වෙනස** | **ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| | **රු.** | **රු.** | **{වාසිදායක/(අවාසිදායක)}** | **(%)** |
| **ආදායම්** | | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන | 157,629,961 | 135,709,694 | 21,920,267 | 16.15 |
| ව්‍යාපෘති ප්‍රදාන | 8,955,724 | 18,978,335 | (10,022,611) | 52.81 |
| මෙහෙයුම් ආදායම් | 63,774,928 | 29,404,202 | 34,370,726 | 116.89 |
| මෙහෙයුම් නොවන ආදායම් | 3,954,929 | 90,824 | 3,864,105 | 4254.49 |
| **වියදම්** | | | | |
| සැපයුම් හා සේවා වියදම් | 15,209,606 | 11,041,272 | (4,168,333) | 37.75 |
| වෙනත්මෙහෙයුම් වියදම් | 104,295,593 | 83,985,662 | (20,309,931) | 24.18 |
| ව්‍යාපෘති වියදම් | 8,955,724 | 18,978,335 | 10,022,611 | 52.81 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කලමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 අප්‍රේල් 20 දින වන විට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී තිබුණු ආයතන අතරින් ලියාපදිංචිය කල් ඉකුත් වී වසර 20 ට වැඩි කාලයක් ගත වී තිබූ ආයතන 20 ක් සම්බන්ධයෙන් හා වසර 01 ත් වසර 20 ත් අතර කාලයක් කල් ඉකුත් වී තිබූ ආයතන 1763 ක් සම්බන්ධයෙන් ලියාපදිංචිය අලුත් කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ලියාපදිංචිය අවසන් වීමට මාස 3කට පෙර ඔවුන් වෙත ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරන ලෙස දන්වා යවා ඇති බව. | ලියාපදිංචිය කල් ඉකුත් වූ ආයතනයන්හි ලියාපදිංචිය අලුත් කිරීමට හෝ ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ කටයුතු කල යුතුය. |
| (ආ) | 2017 වසරේ සිට 2023 වසර දක්වා ආයතන 371 ක් ලියාපදිංචිය අලුත්කර ගැනීම සඳහා ඉල්ලීම්කර තිබුණ ද විගණිත දිනය වන විට ද එම ආයතනවල ලියාපදිංචිය අලුත්කර නොතිබුණි. | අලුත් කිරීම සඳහා අයදුම්පත්‍ර ලැබුණු පසු එම ආයතනය වෙත ගොස් ඇගයීමක් කරනු ලබයි. එම ඇගයීමේදී අදාල නිර්ණායක සපුරා නොමැති ආයතන වල ලියාපදිංචිය අළුත් කරනු නොලබන බව. | පනතෙහි දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචිය අලුත් කිරීමට හෝ පරීක්ෂාවකින් පසු අනීතික ක්‍රියාවන්හි යෙදෙන ආයතන නම් ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඇ) | ලියාපදිංචිය කල් ඉකුත් වූ ආයතන නැවත ලියාපදිංචි කිරීමට සහ එම ආයතන ලියාපදිංචිය අලුත් නොකර වෘත්තීය පුහුණු කටයුතු දිගටම සිදු කරන බවට ක්‍රමානුකූලව පරීක්ෂා කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර නොතිබීම හේතුවෙන් වෘත්තීය පුහුණු ආයතන සම්බන්ධයෙන් කොමිෂන් සභාවෙන් ඉටුවිය යුතු නියාමනය නිසි පරිදි සිදු වී නොතිබුණි. | ලියාපදිංචිය අළුත් නොකර ඇති බොහෝ ආයතන මේ වන විට වසා ඇති බව නිරීක්ෂණය කර ඇත. ලියාපදිංචිය නොලබා පවත්වාගෙන යනු ලබන ආයතනය මඟින් face bookවල පළ කරනු ලබන දැන්වීම් වලට ප්‍රතිවිරුද්ධව (Counter Advertisement) දැන්වීම් මෙම කොමිෂන් සභාවෙන් පළ කරනු ලබන බව. | වෘත්තීය පුහුණු ආයතන සම්බන්ධයෙන් කොමිෂන් සභාවෙන් ඉටුවිය යුතු නියාමනය නිසි පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 හා 2020 වර්ෂවලදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අදියර 6 පාඨමාලා සඳහා අවස්ථා 03 කදී සහතික පත්‍ර 2500 ක් | 2019 හා 2020 වර්ෂ වලදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 6 වන මට්ටම | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන සහතික පත් මුද්‍රණය කිරීමට |

| | | | |
|---|---|---|---|
| | මුද්‍රණය කර තිබුණු නමුත් විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින වන විටත් ඉන් සියයට 99 ක් එනම් රු.295,923ක වටිනා සහතික පත්‍ර 2482 ක් ගබඩාවේ ඉතිරිව පැවතුණි. | පාඨමාලා සඳහා සහතික පත් තොග 2500 ක් අවස්ථා තුනකදී ඇණවුම් කරන ලද බව. | කටයුතු කල යුතුය. |
| (ආ) | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ඇගයුම්කරුවන් සඳහා උඩු කබා (Overcoats) ලබා දීමට 2022 වර්ෂයේදී රු.3,888,000 ක වටිනාකමින් යුතු උඩු කබා (Overcoats) 2000 ක් ලංකා සළුසල ආයතනයෙන් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. විගණිත දිනය වූ 2023 මාර්තු 31 දිනට ඉන් උඩු කබා 1084 ක් එනම් මිලදී ගත් ප්‍රමාණයෙන් සියයට 54 ක් බෙදා නොහැර ඉතිරි වී තිබූ අතර එම කබා බෙදාහැරීමට විධිමත් වැඩ පිළිවෙලක් නිශ්චය කිරීමකින් තොරව මිලදීගැනීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබූ බව විගණනයේදී අනාවරණය විය. | 2023.03.31 දින වන විට පුහුණුව ලත් ඇගයීම්කරුවන් 180 ක් සිටින බැවින් ඔවුන් සඳහා ඉතිරි Overcoats ලබාදීමට කටයුතු කරනු ඇති බව. තවද ඉදිරියේදී ඇගයීම්කරුවන්ගේ සංඝතභාවය පිළිබඳ වැඩසටහන් 10 ක් පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇති අතර, එහිදීද අදාල Overcoats අදාල ගාස්තුව අයකිරීමෙන් අනතුරුව ලබාදීමට කටයුතු කරනු ලබන බව. | අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගෙන අවශ්‍ය මිලදී ගැනීම් සිදු කළ යුතුය. |
| (ඇ) | 2016 පෙබරවාරි 26 දිනැති අංක MSDVT/SSDP/2016-1 දරන නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව වෘත්තීය පුහුණු ආයතන මගින් ඉටුකරන සේවාවන් වඩාත් ගුණාත්මක හා ඉහල තත්ත්වයකින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති තත්ත්ව කළමනාකරණ පද්ධතිය හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පවතින ISO 9001:2008/2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය වෘත්තීය පුහුණු ආයතන විසින් ස්ථාපිත කිරීම අනිවාර්ය කර තිබුණි. එසේ වුවද මේ සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත්කර එපරිදි කටයුතු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් 2019 වර්ෂයෙන් පසුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පසුගිය වකවානුව තුළ රටේ පැවැති ආර්ථික පසුබෑම තුළ බොහෝ ආයතනවල තත්ත්ව කළමනාකරණය සිදුකිරීමට නොහැකි තත්ත්වයක් උදා වුණි. කෙසේ වුවද පැවතුන ආයතනවල තත්ත්ව පද්ධතිය ක්‍රියාත්මක කරගෙන යාමට උපදෙස් ලබා දුන් බව. | නියාමන ආයතනයක් ලෙස කොමිෂන් සභාවේ වගකීම් ඉටුවන සේ ක්‍රියාත්මක විය යුතුය. |